**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය* : මේ වගන්තිය මඟින්, (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1998 අංක 12 දරන ශ්‍රම වාසනා අරමුදල පනතේ 4 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ශ්‍රම වාසනා අරමුදලේ භාරකාර මණ්ඩලයේ සාමාජිකත්වය වැඩි කිරීම වේ.

*3 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ-

(අ) සුභසාධන හා වෛද්‍ය පහසුකම් සැපයීම අරමුදලේ සේවා නියුක්තයන්ගේ යැපෙන්නන්හට ව්‍යාප්ත කිරීම මඟින්;

(ආ) කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමක දී හෝ කාර්මික ආරාවුලක දී සේවා නියුක්තයන්ට නීති ආධාර ලබා ගැනීම සඳහා මූල්‍යමය සහන සැපයීමට ඉඩ සැලසීම මඟින්,

ශ්‍රම වාසනා අරමුදලේ අරමුණු පුළුල් කිරීම වේ.

*4 වන වගන්තිය* : මේ වගන්තිය මඟින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ජාතික ලොතරැයි මණ්ඩලයේ බලතල හා කර්තව්‍යයන්ට ඇතැම් සංශෝධන සිදුකිරීම වේ.

*5 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන යටතේ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් පවත්වනු ලබන ලොතරැයියට අදාළ වන ඇතැම් විධිවිධාන ඒ වගන්තියට ඇතුළත් කිරීම වේ.

*6 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ ජාතික ලොතරැයි මණ්ඩලය විසින් නීති සෑදීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය දැක්වීම වේ.

*7 වන වගන්තිය* : මේ වගන්තිය මඟින් ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි එම වගන්තියේ නීතිය බලපෑම වනුයේ "අමාත්‍යවරයා" යන යෙදුම සඳහා අලුත් අර්ථ නිරූපණයක් ඇතුළත් කිරීම වේ.

